කැස්බෑව නගර සභාව.
-කොළඹ දිස්ත්‍රික්කය-
------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන
---------------

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 23 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 20 දින සභාවේ ලේකම් වෙත යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කල මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කැස්බෑව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
---------------------

පහත සඳහන් ගිණුම්කරන අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මාර්ග අළුත්වැඩියා වෙනුවෙන් ගෙවූ රු.1,261,592 ක් ද, පුස්තකාල පොත් වටිනාකම රු.266,564 ක් ද, ලී බඩු හා කාර්යාල උපකරණ වටිනාකම රු.201,000 ක් ද, අය කර ගත හැකි පොදු පහසුකම් ගාස්තු රු.51,667 ක් ද, ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ආදායම රු.141,500ක්ද,යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ රු.120,000 ක්ද, ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 අසම්භාව්‍ය බැරකම්
---------------------

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව නියමිත පරිදි දායක මුදල් නොගෙවීම නිසා ජනිතවූ රු.935,413 ක අධිභාරය සහ සමාලෝචිත වර්ෂය අවසානයට කැස්බෑව නගර සභාවට විරුද්ධව නොවිසඳී ඇති නඩු 09 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 1.3.3 නොසැසඳු පාලන ගිණුම්
--------------------------

ගිණුම් විෂයයන් 13කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල රු.5,623,987 ක් වැඩියෙන් හා රු.31,480,460 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

2015 දෙසැම්බර් 31 දිනට පොදු පහසුකම් මධ්‍යස්ථානයෙන් හා උදැසන පොළෙන් අයවීමට තිබූ රු. 92,269 ක් වන හිඟ මුදල අයකරගෙන නොතිබූ අතර වර්ෂ 19 සිට වර්ෂ 28 දක්වා පැරණි රු.281,047 ක් වූ විනෝද බදු ශේෂයක් ද, 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලයට අදාල රු.481,578 ක් වන විථී ආලෝක ආධාර ශේෂයක් ද, වර්ෂයකට වඩා පැරණි රු.15,327,222 ක් වූ විවිධ ණයහිමි ශේෂයක් ද, 2016 වර්ෂයට පෙර පැවති රු.15,856,916 ක් වූ පළාත් සභා ණයහිමි ශේෂයක්ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් තුළ විය.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු.583,016,062 ක් වූ ගිණුම් විෂයයන් 08කට අදාල ශේෂයන් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීමෙන් මෙම ශේෂවල නිවැරදි භාවය තහවුරුකර ගැනීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | **අනුකූල නොවීම්** |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| මු.රෙ. 104 (2) | 2016 ජුනි 28 දින කැබ් රථයකට සිදුවූ අනතුර සම්බන්ධයෙන් අදාල බලධාරීන් වෙත වාර්තා කර නොතිබුණි. |
| මු.රෙ. 110 | ආයතනය තුළ සිදුවන පාඩු හා හානි සම්බන්ධයෙන් සටහන් තැබීම සඳහා හානි හා පාඩුලේඛනයක් නඩත්තුකර නොතිබුණි. |
| මු.රෙ.133 (1) සහ (2) | අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු සංවිධානය කරගෙන නොතිබුණි. |
| මු.රෙ. 188 (2) | 2010 දෙසැම්බර් 31 දින තැන්පත් කළ රු. 3,386 ක චෙක්පතක් හා 2012 දෙසැම්බර් 18 දිනැති වටිනාකම රු. 1,714 ක් වන මුදල් ඇණවුම් 3ක් සම්බන්ධයෙන් සහ රු.1,492 ක් වටිනා අගරු චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| මු.රෙ. 200 (4) | වටිනාකම රු. 642,992 ක් වූ ගෙවීම් වවුචර් 4 ක වියදම් සහතික කල නිළධාරියා අත්සන් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | මු.රෙ. 225 | ගෙවීම් සඳහා නිවැරදි ආකෘතිපත්‍ර යොදාගත යුතු වුවත් රු.1,203,500 ක ගෙවීම් වවුචර් 4 ක් වෙනුවෙන් නිවැරදි ආකෘතිපත්‍ර භාවිතා කර නොතිබුණි. |
| | මු.රෙ. 226 | රු. 9,056,260 ක් වටිනා ගෙවීම් වවුචර් 12 ක ගෙවීම සඳහා වන අධිකාරි බලය සඳහන් නොකර ගෙවීම් කර තිබුණි. |
| | මු.රෙ. 371 (2) | ලබාගත් අත්තිකාරම් මුදල් අදාළ කාර්ය නිමවූ වහාම නිරවුල් කළ යුතු වුවත් වර්ෂ ගණනාවක සිට පැවත එන රු.353,026 ක් වූ අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| | මු.රෙ. 571 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී පැවති රු.30,998,512 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පත් ශේෂය තුළ වසර 02 ක කාලයක් ඉක්මවා තිබූ රු.6,595,637 ක ශේෂ නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | මු.රෙ. 756 | මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු. 253,880,013 ක් වටිනා ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් වර්ෂය අවසානයට සත්‍යාපනයක් සිදුකර නොතිබුණි. |
| | මු.රෙ. 1645 (ඇ) | සභාව සතු ඇතැම් වාහනවලට අදාළ දෛනික ධාවන සටහන් අසම්පූර්ණ ලෙස පවත්වා ගෙන ගොස් තිබුණි. |
| | මු.රෙ. 1646 | දෛනික ධාවන සටහන් හා ඊට අදාළ මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර නොතිබුණි. |
| | මු.රෙ. 1653 | සභාව සතු වාහන 14ක මයිලෝ මීටර වර්ෂ 07කට වැඩි කාලයක සිට අක්‍රියව පැවතුන නමුත් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| **(ආ)** | **1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදය** | සභාව සතු වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් කර නොතිබුණි. |
| **(ඇ)** | 2008 ජනවාරි 25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ “ඇ” කොටස | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2014 ජනවාරි 09 දිනැති පළාත් පාලන කොමසාරිස් (බස්නාහිර පළාත) ගේ අංකLGD/7/7/1/D1-2013 දරන ලිපිය | සභාවේ සේවාවන් සඳහා අවුරුදු 60 ට වැඩි සේවකයන් සේවයේ යොදවා නොගත යුතු වුවද අවුරුදු 60 ට වැඩි සේවකයන් 4 දෙනෙකු 2016 ජූලි 31 දක්වා කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගෙන රු. 2,309,177 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 57,026,425 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 103,195,690 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ලේකම් විසින් ඉදිරිපත් කර තිබුණු තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ සාරාංශගත තොරතුරු පහත දැක්වේ.

| | 2016 | | | | 2015 | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂය | තථ්‍ය අයකරගත යුතු | තථ්‍ය අයකරගත් | වර්ෂයට හිඟය | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | තථ්‍ය අයකරගත යුතු | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. 000 | රු. 000 |
| වරිපනම් හා බදු | 35,000 | 26,953 | 8,047 | 21,369 | 41,207 | 27,175 |
| බදු කුලී | 6,924 | 5,894 | 1,029 | 1,637 | 12,610 | 2,937 |
| බලපත්‍ර ගස්තු | 1,200 | 1,413 | - | 70 | 6,150 | 1,150 |
| වෙනත් ආදායම් | 189,302 | 203,215 | - | 279,128 | 218,303 | 275,212 |
| | **232,426** | **237,475** | **9,076** | **302,204** | **278,270** | **306,474** |

#### 2.2.2 වරිපනම්

සමාලෝචිත වර්ෂයට බිල් කළ රු. 35,000,000 ක් වන වරිපනම් ආදායමෙන් සියයට 25.27 හෙවත් රු. 8,844,905 ක් වර්ෂය තුළ දී අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබූ අතර 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 26,749,745 ක් වන හිඟ වරිපනම් මුදලෙන් සමාලෝචිත වර්ෂය තුළ දී අයකරගෙන තිබුණේ සියයට 50.19 ක් හෙවත් රු.13,427,206 ක් පමණි.

### 2.2.3 කඩ කාමර කුලී

සභාවට අයත් කුලියට දී තිබුණු කඩකාමර 104 කින් 2016 දෙසැම්බර් 31 දිනට හිඟය රු. 1,637,783 ක් වු අතර එම හිඟ කඩ කුලිය තුළ වටිනාකම රු. 455,415 ක් වූ වර්ෂ 05 කට වඩා පැරණි ශේෂ ඇතුළත්ව තිබුණි.

### 2.2.4 වෙළඳ බලපත්‍ර

සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කළ යුතුව තිබූ වෙළඳසැල් 1,412 න් වෙළඳසැල් 1,213 ක් සඳහා වෙළඳ බලපත්‍ර වෙනුවෙන් මුදල් අයකර තිබුණ ද, අදාල බලපත්‍ර නිකුත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු. 141,500 ක් වු ශේෂය තුළ ඇතුළත් රු. 136,500 ක් පෙර වර්ෂයන් සඳහා ලැබිය යුතු බලපත්‍ර ගාස්තු විය. 2016 ජනවාරි 01 දිනට ලැබිය යුතු රු. 113,575 වු හිඟ මුදලෙන් සමාලෝචිත වර්ෂය තුළ අයකරගෙන තිබුනේ සියයට 38.6 ක් හෙවත් රු. 43,830 ක් පමණි

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

**පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.**

(අ) සේවකයින් විසින් තැන්පත් කරන ලද රු. 82,500 ක් වු වටිනා ඇප මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආයෝජනය නොකොට සභාව තුළ රඳවා තිබීම නිසා එම මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන පොලි ආදායම අහිමි වී තිබුණි.

(ආ) සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරිය සමඟ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට පැවති රු. 16,901,660 ක් වු ශේෂය දිගු කාලයක් තුළ මෙහෙයුම් වලින් තොරව පැවතුණි.

(ඇ) සභාව විසින් කසළ බැරල් මිලදී ගැනීම සඳහා පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට රු. 607,445 ක් වු ශේෂය 2009 වර්ෂයේ සිට අක්‍රියව පැවතුණි.

(ඈ) 2009 වර්ෂයේ සිට සභාව විසින් පවත්වාගෙන එන ලද ඉතිරි කිරීමේ ගිණුමක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 5,859,262 ක් වූ අතර එම මුදල ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ඉ) ආදායම් උපයමින් තිබූ සභාව සතු පැරණි තානායම කඩා ඉවත්කර ඒ සඳහා රු. 52,929,240 ක ඇස්තමේන්තුවක් යටතේ නව ගොඩනැගිල්ලක පළමු අදියර ඉදිකර 2014 දෙසැම්බර් 04 දින සභාවට භාරදී තිබුණි. තානායමින් සමාලෝචිත වර්ෂයේ රු. 3,000,000 ක ආදායමක් අපේක්ෂා කර තිබුණද, 2017 ජුනි 16 දින වන විටත් මෙම ගොඩනැගිල්ලෙන් කිසිදු ආදායමක් ලැබී නොතිබූ අතර එය කිසිම ඵලදායි කාර්යයක යොදවා නොතිබුණි.

### 3.2 මෙහෙයුම් ආකාර්යක්ෂමතා

(අ) සභාව සතු වරිපනම් ආදායම් කළමණාකරණය කර ගැනීම සඳහා 2007 වර්ෂයේ දී පෞද්ගලික ආයතනයකින් මිල දී ගෙන ස්ථාපිත කර තිබූ පරිගණක මෘදුකාංග පද්ධතිය තුළින් වරිපනම් අංශයේ කිසිදු යාවත්කාලීන කරන ලද තොරතුරක් ඒකාබද්ධ කර හෝ සාරාංශගතව ලබාගැනීමට නොහැකි වූ අතර පද්ධතියේ පවත්නා අඩුපාඩු රාශියක් නිවැරදි කර ගැනීමට සභාව කටයුතු කර

නොතිබුණි. එසේම පරිගණකගත කරනු ලබන තොරතුරු සම්බන්ධව නිසි අධීක්ෂණයක් හා දත්තවල ආරක්ෂාව සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) බටකැත්තර සුසාන භූමිය, 9 වන පටුමගේ ඇති ප්‍රවේශ මාර්ගය, විදුලි පහන් කණුව යාබඳ ඉඩම් හිමිකරුවන් විසින් අනවසරයෙන් අල්ලා ගැනීම සහ එම ඉඩම් කට්ටි සඳහා හිමිකම් සහතික නිකුත් කිරීම සම්බන්ධයෙන් 2016 ඔක්තෝබර් 24 දිනැති සාකච්ඡාව අනුව මාර්ගයේ හැරවුම් වෘත්තය සම්බන්ධයෙන් නගර සභාව විසින් සිදුකළ යුතු කටයුතු 2017 ජූනි 16 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ඇ) බාහිර පාර්ශවයන් විසින් 2011 ඔක්තෝබර් 06 දින සභාවට විරුද්ධව පවරා ඇති අංක 2483 දරන නඩුවෙන් ඉල්ලා ඇති අලාභය රු.350,000 ක් වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට නඩුව සඳහා සභාව දරන ලද වියදම රු.457,750 ක් වී තිබුණි.

(ඈ) සභාව විසින් විථි පහන් සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

## 3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

රු. 2,256,000 ක් පිරිවැය වූ වාහන 04 ක් වර්ෂ 02 සිට වර්ෂ 05 ක් දක්වා කාලයක්ද, අධි ධාරිතාවයෙන් යුතු කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් වර්ෂ 05 ක කාලයක් තිස්සේ නිශ්ක්‍රීයව තිබුණි.

## 3.4 හඳුනාගත් අලාභ

පිළියන්දල මහජන පුස්තකාලයෙන් බාහිර පාඨකයන් විසින් 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාල සීමාව තුළ බැහැර ගෙන ගොස් ආපසු භාර නොදුන් රු. 61,982 ක් වටිනා පොත්වල සහ සාමාජිකයන් විසින් නැති කරන ලද රු. 10,597 ක් වටිනා පොත්වල වටිනාකම වගකිවයුත්තන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කළ යුතු සංවර්ධන ව්‍යාපෘති 06 ක් සඳහා රු.6,677,563 ක් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් රු.3,290,966 ක් වටිනා ව්‍යාපෘතිය වෙනුවෙන් ගිවිසුම් අත්සන්කර නොතිබූ අතර ව්‍යාපෘති 04 ක වැඩ ආරම්භ කර නොතිබුණි.

## 3.6 කාර්ය මණ්ඩල පරිපාලනය

2016 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 04 | 03 |
| තෘතියික | 02 | 02 |
| ද්විතියික | 61 | 62 |
| ප්‍රාථමික | 141 | 122 |
| | **208** | **189** |

(අ) තෘතියික හා ද්විතියික මට්ටමේ තනතුරු 03 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත ස්ථිර සේවක සංඛ්‍යාව 42 ක් වුවද, තථ්‍ය ස්ථිර සේවක සංඛ්‍යාව 46 ක් වී තිබුණි.

(ආ) සභාවේ නාගරික ලේකම් තනතුරට තෘතියික ශ්‍රේණියේ පරිපාලන නිළධාරිණියක් වැඩ බැලීම සඳහා පත්කර තිබූ අතර ගණකාධිකාරි තනතුරට කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික ගණකාධිකාරිවරියක් බඳවා ගෙන තිබුණි.

(ඇ) පුරප්පාඩුව පැවති මෙම තනතුරු ඇතුළුව ස්ථිර සේවක මණ්ඩලයෙහි තනතුරු 14 ක් හා සේවක පුරප්පාඩු 24 ක් සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී කටයුතු කර නොතිබුණි.

(ඈ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව තාවකාලික, අනියම් (දෛනික) ආදේශ, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගෙන ඇති සේවකයන් 48 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබා දී තිබූ නමුත් මෙම තනතුරුද ඇතුළත් වන පරිදි සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් යාවත්කාලීන කරවා ගෙන නොතිබුණි.

(ඉ) ඉහත (ඈ) ට අනුව බඳවාගත් සේවකයන් 48 දෙනා සඳහා 2015 හා 2016 වර්ෂ වලදී වැටුප් වශයෙන් ගෙවා තිබූ රු. 32,916,249 ක මුදල ප්‍රතිපූර්ණය කරගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ඊ) අනුමත ස්ථිර සේවකයන්ට අමතරව සභාවේ ව්‍යාපෘති වෙනුවෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබූ සේවකයන් 23 දෙනෙකුට වැටුප් හා දීමනා ලෙස රු. 5,701,472 ක් සමාලෝචිත වර්ෂය තුළ දී සභා අරමුදලින් ගෙවා තිබුණි.

### 3.7 වාහන උපයෝජනය

(අ) බාහිර ආයතන නමින් ලියාපදිංචි කර තිබූ රු. 2,732,000 ක් වටිනා වාහන 3 ක් සභාව නමින් ලියාපදිංචි කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වාහන ඇණිය තුළ පවතින රු. 1,834,000 ක් වටිනා වාහන 6 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

(ඇ) දෛනික ධාවන සටහන් සම්බන්ධයෙන් පිළියෙල කළයුතු මාසික සාරාංශය පිළියෙල කර නොතිබුණි.

(ඈ) සභාව සතු වටිනාකම රු. 249,000 ක් වූ ධාවනය වන ට්‍රැක්ටරයක් සහ වටිනාකම දක්වා නොතිබූ ට්‍රැක්ටර් 15 ක් සභාවේ ස්ථාවර වත්කම් ලේඛනයට හා වාහන ලැයිස්තුවට ඇතුළත් කර නොතිබුණි.

### 3.8 කසළ කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් තුන්දෙනෙකුද ඇතුළුව 109 දෙනෙකුගෙන් යුත් කාර්යමණ්ඩලයක් කසළ කළමනාකරණය සඳහා යොදවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ කසළ කළමනාකරණ වියදම රු. 81,304,068 ක් වී තිබුණි. එසේ වුවද කසළ බදු ආදායම රු.4,346,049 ක් වූයෙන් කසළ බදු ආදායමෙන් පියවාගත් වියදම සියයට 5.34 ක් වැනි අඩු මට්ටමක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ කරදියාන කසළ අංගනයට වෙන්කළ කසළ ටොන් 3,128 ක් හා මිශ්‍ර කසළ ටොන් 16,238 ක් සභාව විසින් බැහැර කර තිබූ අතර මුළු කසළ ප්‍රමාණයෙන් මිශ්‍ර කසළ ප්‍රතිශතය සියයට 84 ක් වී තිබුණි.

(ඇ) සමස්ත සභා බලප්‍රදේශයෙන් සියයට 20 ක වපසරියක් තුළ කසළ කළමනාකරණය ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සභාව අපොහොසත් වී තිබුණි.

(ඈ) සමාලෝචිත වසර අවසානයට ලැබිය යුතු කසළ ගාස්තු වටිනාකම රු. 1,903,443 ක් වී තිබුණි.

(ඉ) අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළ කසළ බදුන් 1050ක් පරිත්‍යාග වශයෙන් සභාව වෙත ලබාදී තිබියදී 2016 නොවැම්බර් 11 දින සභාව විසින් පෞද්ගලික ආයතනයකින් රු. 391,208 ක මුදලක් ගෙවා බදුන් 1200 ක් මිලදී ගෙන තිබුණි. පරිත්‍යාග වශයෙන් ලැබුණු කසළ බදුන් 1050 ක ප්‍රමාණයක් 2017 ජනවාරි 20 දින බෙදාහැර තිබුණු අතර මිලදී ගත් බදුන් 1200 න් කිසිවක් 2017 ජූනි 15 දින වන විටත් බෙදාහැරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) මෙම නගර සභාව ඇතුළු පලාත් පාලන ආයතන 07 ක් කසළ බැහැර කිරීම සිදුකරනු ලබන කරදියාන අපද්‍රව්‍ය අංගනය පිහිටි භූමියෙන් සියයට 80 ක පමණ භූමි ප්‍රමාණයක් කැස්බෑව නගර සභා බල ප්‍රදේශයට අයත් වන බැවින් සභා බලප්‍රදේශයේ ජනතාවට ඉදිරියේදී අයහපත් සෞඛ්‍ය ගැටළු හා අවදානම් තත්වයන් ඇතිවිය හැකිය.

### 3.9 ඩෙංගු මර්ධන වැඩසටහන

ඩෙංගු මර්ධන වැඩසටහන් සඳහා 2016 වර්ෂයේදී කැස්බෑව නගර සභාව විසින් රු.1,071,117 ක් වැය කර තිබූ අතර සභා බල ප්‍රදේශය තුළ පසුගිය වර්ෂයේ 416 ක් වූ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේ දී 686 ක් දක්වා වැඩි වී තිබුණි. පසුගිය වර්ෂයේ ඩෙංගු මරණ වාර්තා වී නොතිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ මරණ දෙකක් වාර්තා වී තිබුණි. ඩෙංගු මර්ධනය සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සංඛ්‍යාව, පරීක්ෂාවට භාජනය කළ ස්ථාන සංඛ්‍යාව, නිකුත් කළ රතු නිවේදන සංඛ්‍යාව හා පවරන ලද නඩු සංඛ්‍යාව පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වැඩි වී තිබුණ ද, හඳුනාගත් මදුරුවන් බෝවිය හැකි ස්ථාන සංඛ්‍යාව, ඩෙංගු කීටයන් සහිත ස්ථාන සංඛ්‍යාව ද වැඩි වී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව ඩෙංගු රෝගය පැතිර යාම වළක්වා ගැනීමට හා රෝගීන් සංඛ්‍යාව අවම කරගැනීමට සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ඩෙංගු මර්ධන වැඩ සටහන් අසමත්ව තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

(අ) ඇස්තමේන්තුගත ආදායම් ඉලක්ක සපුරාගත නොහැකි වූ ආදායම් විෂයයන් 7 ක අපේක්ෂිත ආදායම රු. 4,200,000 ක් වුවද තථ්‍ය ආදායම රු. 1,756,611 ක් වී තිබුණි.

(ආ) වැය විෂයයන් අතර ප්‍රතිපාදන මාරුකිරීමෙන් අනතුරුව මුළු අයවැය ප්‍රතිපාදනය ශුන්‍යවූ වැය විෂයයන් 06 කින් රු.473,112 ක් වියදම් කර තිබීම හේතුවෙන් රු.473,112 කින් අයවැය ප්‍රතිපාදන ඉක්මවා වියදම් කර තිබුණි.

(ඇ) වැය විෂයයන් අතර ප්‍රතිපාදන මාරුකිරීමෙන් අනතුරුව වැය විෂයයන් 32 ක මුළු අයවැය ප්‍රතිපාදනය රු.93,434,000 ක් වුවද, සමාලෝචිත වර්ෂය තුළ වැය කරන ලද ප්‍රමාණය රු.129,574,018 ක් වුයෙන් අයවැය ප්‍රතිපාදනය ඉක්මවා රු. 35,140,018 ක් වියදම් කර තිබුණි.

(ඈ) වැය විෂයයන් 10 ක මුළු අයවැය ප්‍රතිපාදනය රු. 711,000 ක් වුවද, ප්‍රතිපාදන සීමාව ඉක්මවා එම වැය විෂයයන්ගෙන් රු. 2,735,700 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට අසාමාන්‍ය ලෙස මාරු කර තිබුණි. එම වැය විෂයයන් 10 න් 07 ක රු. 306,378 ක වියදමක් දරා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන ඉක්මවා රු. 2,331,078 ක් වැය කර තිබුණි.

**5. පද්ධති හා පාලනය**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහිද විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) අයවැය පාලනය
(ඉ) ස්ථාවර වත්කම් හා තොග පරිපාලනය
(ඊ) සේවක මණ්ඩලකළමනාකරණය
(උ) ණයගැති හා ණයහිමි පාලනය
(ඌ) අභ්‍යන්තර විගණනය